# ජාතියේ ඉතිහාසය

පසුගිය සතියක (පෙබරවාරි 17) ලිපියකින් සහ තවත් ලිපිවලින් අපි සිංහල ජාතියේ සම්භවය ගැන කතා කෙළෙමු. ඒ සම්බන්ධයෙන් විවිධ මතිමතාන්තර ඇති නමුත් අපේ අදහස වනුයේ භාරතයෙන් පැමිණි අර්ධ වෛදිකයන් හා මෙරට එවකටත් ජීවත්වූ විවිධ ගෝත්‍ර සියවස් කිහිපයක් ගතවීමෙන් පසු පණ්ඩුකාභය රජු දවස සිංහල ජාතිය ගොඩනැගූ බව ය. එහි දී ඒ ක්‍රියාදාමයට විරුද්ධව සිටි ගෝත්‍රය වැදි ගෝත්‍රය යැයි අපි සිතමු. එ පමණක් නොව යක්‍ෂ ගෝත්‍රයෙහි ඇතැම් නායකයන් ද එයට විරුද්ධ වූ බව ද ඔවුන් වැදි ගෝත්‍රයට සිංහල ජාතිය ගොඩනැගීමේ කාර්යයට හවුල් නොවීමට උපදෙස් දුන් බව ද වංශකතා හා ජනප්‍රවාද ආශ්‍රයෙන් අපට අනුමාන කළ හැකි ය. මා මෙහි දී අනුමාන යන පදය යොදාගන්නේ ව්‍යවහාර අර්ථයෙන් නොව සිංහල බෞද්ධ ඥානවිභාගයෙහි දැනුම ලබාගැනීමේ එක් මගක් ලෙස දක්වා ඇති ක්‍රමයක් හැඳින්වීම සඳහා ය. එයට වඩාත්ම සමීප ඉංගිරිසි පදය ඉන්ෆරන්ස් යන්න විය හැකි ය.

එලෙස සිංහල ජාතිය (ජාතිය යනු කුමක් දැයි නිර්වචනය කරගැනීමට නොහැකි බටහිර සමාජයීය විද්‍යාවන්හි ජාතිය පිළිබඳ ව දැක්වෙන මතිමතාන්තර මෙහි දී ප්‍රතික්‍ෂෙප කෙරෙයි.) ගොඩනැගීමෙන් පසුව මෙහි පැමිණි ආක්‍රමණිකයන්ට හා සංක්‍රමණිකයන්ට සිදුවූයේ කුමක් ද යන ප්‍රශ්නය දැන් අප හමුවේ වෙයි. මේ ප්‍රශ්නයට ද අපි පිළිතුරු දී ඇත්තෙමු. ආක්‍රමණිකයන්ගෙන් ඇතැමකු ආපසු යන්නට ඇත. තවත් අය යුද්ධවලින් හා වෙනත් හේතුවලින් මිය යන්නට ඇත. මෙහි ඉතිරි වූවන් හා සංක්‍රමණිකයන් අති විශාල පිරිසක් සිංහල ජාතියෙහි බින්න බැස ඇති බව (සිංහල ජාතියට අවශෝෂණය කෙරී ඇති බව) පැහැදිලි ය. යාපනය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්යව සිටි කාර්තිගේසු ඉන්ද්‍රපාල මහතා කොටි සංවිධානයේ බලපෑම්වලට යටත්වීමට පෙර ලියන ලද ලිපිවල හා ලන්ඩන් විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලද නිබන්ධනයෙහි ඉතා පැහැදිලි ව සඳහන්කර ඇත්තේ එකොළොස්වැනි සියවසට පෙර මෙරට ස්ථිර දෙමළ වාසස්ථාන නොතිබූ බව ය.

සංක්‍රමණිකයන්ගෙන් ඇතැමකු විශේෂයෙන් ම සිංහල ජාතිය ඇතිවීමට පෙර වැදි ගෝත්‍රයට ද අවශෝෂණය වන්නට ඇත. කුවේණියගේ හා විජයගේ දරුවන් වැද්දන් වී ඇති බවට ජනප්‍රවාදයෙහි හා වංශකතාවල පැවසෙන කතා අපට පහසුවෙන් බැහැර කිරීමට නො හැකි ය. බොහෝවිට සිදුවන්නට ඇත්තේ සිංහල ජාතිය ආරම්භවීමට පෙර නැගෙනහිර දඹදිවින් පැමිණි අර්ධ වෛදිකයන්ගෙන් හා බටහිර දඹදිවින් පැමිණි සුළු පිරිසෙන් (මහාවංශ කතාවෙහි විජය කුමරු හා පිරිස රැගත් නැව දඹදිව නැගෙනහිරින් පිටත් කර ලංකාවට පැමිණීමට පෙර බටහිර වෙරළට යවන්නේ කුමක් අරභයාදැයි කල්පනා කරන්න) යම් යම් අය ඒ ඒ ගෝත්‍ර සමග මිශ්‍ර වීම ය. වැදි ගෝත්‍රය හැරෙන්නට අනෙක් ගෝත්‍ර සමග මිශ්‍ර වූ අය කල් යැමේ දී සිංහල ජාතියට අනුකලිත වූ බැවින් ඒ විවිධ ගෝත්‍ර ගැන සඳහන්කිරීමේ අවශ්‍යතාවක් එක් අතකින් පැන නොනගී. අනෙක් අතින් සිංහල ජාතිය ගොඩනැගීමෙද දී ඒ ගෝත්‍රවලින් වූ දායකත්වය හෙළි නොකිරීම සඳහා ද ඒ මිශ්‍රණ සෘජුව සඳහන් නොකිරීමට වූ අවශ්‍යතාවක් ද වෙයි. එහෙත් වැදි ගෝත්‍රය සිංහල ජාතියට ඇතුළත් නොවූ බැවින් සංක්‍රමණිකයන් හා වැදි ජනයා අතර වූ මිශ්‍රණය විස්තර කරන කතාවක් ජනප්‍රවාදයට හා වංශකතාවලට ඇතුළත් වී තිබේ. ඇතැම්විට සංක්‍රමණිකයන් හා ගෝත්‍ර අතර වූ සියළු මිශ්‍රණ වැදි ගෝත්‍රයට පමණක් බැරකිරීමේ චේතනාව ද ජනප්‍රවාද ගෙතුවන්ට (නිර්මාණය කළ අයට) තිබෙන්නට ඇත.

ජනප්‍රවාද හා අද බටහිර විද්‍යාඥයන් ගොතන ප්‍රවාද අතර මූලික වෙනසක් නැත. බටහිර විද්‍යාඥයන් ගොතන ප්‍රවාදවලට ඉංගිරිසියෙන් තියරි යන නම යොදා එයට දේවභාෂිතයක් යන තේරුමක් ආරෝපණය කර ඇත. තියරි යන්න දේව යන තේරුම ඇති තියෝ යන්නෙන් බිඳී ඇත. බටහිර දැනුමට ජනතාව අතර ආධිපත්‍යයක් ඇතිකිරීම සඳහා තියරි තීසීස් ආදී දේව මූලයක් ඇති වචන යොදා ගැනෙයි. එහෙත් ජනප්‍රවාද මෙන් ම ප්‍රවාද ද බොහෝ විට යම් ප්‍රශ්නයකට හෝ ප්‍රශ්න කිහිපයකට හෝ දී ඇති පිළිතුරු වෙයි. ඒ පිළිතුරු හුදී ජනයා විසින් නිර්මාණය කෙරුණු විට ඒවා ජනප්‍රවාද නමින් ද බටහිර විද්‍යාඥයන් අතින් නිර්මාණය කෙරුණු විට ප්‍රවාද නමින් ද හැඳින්වෙයි.

ජනප්‍රවාද, වංශකතා, පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික සාධක (සාධක ප්‍රවාදවලින් ස්වායත්ත නොවන බව අමතක නොකළ යුතු ය.) ආදිය අතර පරස්පර අවමයක් වූ ඉතිහාසයක් අනුමානයෙන් නිර්මාණය කිරීමට අප උත්සාහ දැරිය

© Prof. Nalin De Silva

යුතු ය. ඉතිහාසය යනු ද දැනුම් පද්ධතියක් ලෙස ගත්කල බටහිර විද්‍යාවන් මෙන් ම නිර්මාණයකි. එහි කිසිදු අවුලක් නැත. එහෙත් ඒ නිර්මාණය සමස්තය තුළ හැකිතාක් විසංවාදවලින් තොර විය යුතු ය. එක් එක් අයගේ හිතළු ඉතිහාසය හෝ භෞතික විද්‍යාව හෝ ලෙස ඉදිරිපත් කළ නො හැකි ය. සියළු දැනුම් යනු මිනිසා අනිත්‍ය දුක්ඛ අනාත්ම අනාවබෝධයෙන්, එනම් අවිද්‍යාවෙන්, සාපේක්ෂව නිර්මාණය කරන, එනම් සංස්කරණය කරන දෑ වෙයි. වැඩි විස්තර සඳහා මගේ ලෝකය කියවන්න. එහෙත් ක්වොන්ටම්වාදය ගැන මෙලෝ හසරක් නොදැන ඒ කියවා මගේ ලෝකය ගැන පොතක් ද ලියූ මාක්ස්වාදී අප්‍රබුද්ධයා මෙන් නොකියවන්න. මේ අප්‍රබුද්ධයා හා ඔහුගේ දේශපාලන පක්ෂය ක්වොන්ටම් යාන්ත්‍රිකය, දැනුම, යථාර්ථය ආදිය සම්බන්ධයෙන් සංවාදයකට එළඹෙන්නේ නම් ඔහුටත් ඔහුගේ පක්ෂයේ අනෙක් අයටත් තම තරම වටහාගත හැකිවනු ඇත.

සිංහල ජාතියේ ඉතිහාසය එසේ තේරුම් ගන්නා අප දෙමළ ජනයාගේ ඉතිහාසය නිර්මාණය කර ගන්නේ කෙසේ ද? මෙරට දෙමළ ජනයාට එළාර හෝ සේන ගුත්තික හෝ කරා දිවෙන ඉතිහාසයක් නැත. ඒ අය දෙමළ ආක්‍රමණිකයන් යැයි උපකල්පනය කළ ද (ඒ එසේ නොවන බවට සාක්ෂි වෙයි) එකල ඇති වූ නිත්‍ය දෙමළ වාසස්ථානයක් අඛණ්ඩව පැවති බවට කිසිදු ඓතිහාසික වාර්තාවක් නැත. මහාචාර්ය ඉන්ද්‍රපාල මහතාගේ ප්‍රාග් කොටි ලිපි ලේඛනවලින් පැහැදිලිවන්නේ ද ඒ බව ය. නිත්‍ය වාසස්ථානයක් නැති පිරිසකට රාජ්‍යයක් හෝ ජාතියක් හෝ ගොඩනැගිය හැකි නො වේ. ලංකාවේ නොව භාරතයේ ද කිසිදා දෙමළ රාජ්‍යයක් නොවිණි. භාරතයේ දකුණේ තිබූ රාජධානි චෝළ, චේර, පාණ්ඩ්‍ය, විජය නගර්, පල්ලව (මෙය ද්‍රවිඩ රජවරුන්ගේ රාජ්‍යයක් ද යන්න පිළිබඳ ප්‍රශ්න වෙයි) ආදී වශයෙන් රජවරුන්ගේ වංශ නමින් හඳුන්වනු ලැබූ  රාජ්‍ය වෙයි. උත්තර භාරතයට ද මේ කරුණ අදාළ වෙයි. උත්තර භාරතයේ තිබුණේ ද වාංශික රාජ්‍ය ය. අශෝක රජුගේ රාජ්‍යය හඳුන්වනු ලුබුයේ මෞර්ය යන රාජ වාංශික නමිනි. ඉන් පෙර ඇතැම් විටෙක ප්‍රදේශ වශයෙන් රාජ්‍ය හඳුන්වනු ලැබූ බව පෙනෙයි. එහෙත් ඒ බව නිශ්චිත ව කිව හැකි නො වේ. ඇතැම් විට රාජ වංශයේ නමින් ප්‍රදේශය හඳුන්වනු ලැබුවා විය හැකි ය. කොසොල්, ලිච්ඡවි පමණක් නොව ශාක්‍ය රජවරු ද උතුරු දඹදිව විසූහ. මගධය තරමක ප්‍රශ්නයකි. කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය ජයසේන මහතා සඳහන් කරන ආකාරයට මගධය ඩේරියස් රජු අතින් පැරදී දඹදිවට පළා ආ මඝයන් විසින් ගොඩනැගිණි නම් ඒ ප්‍රශ්නය ද යම් ප්‍රමාණයකට හෝ විසඳෙයි.

ඒ කෙසේ වෙතත් අපට සාධාරණ (පොදු යන අර්ථයෙන්) ප්‍රවාදයක් ලෙස ප්‍රකාශ කළ හැක්කේ දඹදිව (හා භාරතයේ) රාජ්‍ය රජවරුන්ගේ වංශ නමින් හඳුන්වනු ලැබූ බව ය. ඒ ඒ රාජ්‍යවල විවිධ ගෝත්‍රවලට හා වංශවලට අයත් විවිධ භාෂා කතාකරන ජනයා ජීවත්වූ බවත් ඔවුන් ජාතියක් ලෙස එකතු නුවූ බවත් පැහැදිලි ය. ඒ නයින් අපට කිව හැක්කේ දඹදිව (හා භාරතයේ) පැවතුණේ වාංශික රාජ්‍ය බව ය. මේ තත්වය ලංකාවේ සිංහල ජාතිය ඇතිවීමෙන් පසුව නැති වී ගියේ යැයි අපට කිව හැකි ය. සිංහල ජාතියට මෙරට ජාතික රාජ්‍යයක් පිහිටුවීමට හැකි විය. මෙරට ලම්බකර්ණ, මෞර්ය ආදී වාංශික රජවරු සිටිය ද රාජ්‍යය සිංහල මිස වාංශික නො වී ය. මෙරට රාජ්‍යය ලම්බකර්ණ රාජ්‍යයක් හෝ මෞර්ය රාජ්‍යයක් හෝ ලෙස හඳුන්වනු නො ලැබිණි.

අපට මේ සියල්ල වැදගත් වන්නේ යාපනයේ ආර්ය චක්‍රවර්ති රාජ්‍යය ගැන සඳහන් කරන විට ය. ආර්ය චක්‍රවර්ති යනු කිනම් ආකාරයෙන් සලකා බැලුව ද වංශයකි. ලංකාවට පැමිණි ආර්ය චක්‍රවර්තීහු මුහුදු කොල්ලකරුවෝ වූහ. සිංහල රාජ්‍යයේ අගනුවර අනුරාධපුරයෙන් හා පොළොන්නරුවෙන් බැහැරට ගෙන යෑමෙන් පසුව නාග දීපය (යාපන අර්ධ ද්වීපය) අනාරක්ෂිත විය. මුහුදු කොල්ලකරුවන් පැමිණ ආර්ය චක්‍රවර්ති රාජ්‍යය පිහිටුවා ගත්තේ මෙකල ය. මේ රාජ්‍යය සම්බන්ධයෙන් කිවයුතු වැදගත් කරුණු තුනක් වෙයි. පළමුවෙන් ම ඒ දෙමළ රාජ්‍යයක් නො වී ය. ඒ වාංශික රාජ්‍යයක් විය. රජවරුන්ගේ වංශය වුව ද ද්‍රවිඩ වංශයක් නොවූ බව ආර්ය චක්‍රවර්ති යන නමින් කියැවෙයි. දෙවනුව එහි බහුතරය දෙමළ වැසියන් වූ බවට සාක්ෂි නැත. එහි දෙමළ වැසියන් සමග මලයාලම් බස කතා කළ වේලක්කාරයෝ ද සිංහල කතාකළ සිංහලයෝ ද විසූහ. එක් භාෂාවක් කතාකරන, එක් සංස්කෘතියකට අයත් ජනයා එහි නො විසූහ. ඒ රාජ්‍යය පැහැදිලිව ම  දඹදිව (භාරතීය) ආකෘතියේ වාංශික රාජ්‍යයක් විය. තුන්වැනුව ආර්ය චක්‍රවර්තී රාජ්‍යය ස්වෛරී රාජ්‍යයක්  නො වී ය. ආර්ය චක්‍රවර්තී රජු ගම්පොළ විසූ සිංහල රජු හෙවත් සිංහලයේ රජු පඬුරු සහිතව බැහැ දැක තමාට රජ යන නම යොදාගැනීමට අවසර ලබාගත් බවට සාක්ෂි වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva